# RAJARATA UNIVERSITY OF SRI LANKA
## Centre for Distance and Continuing Education (CDCE)
## DIPLOMA IN ENGLISH (EXTENSION) - YEAR 2025(INTAKE 25)
**(Online or Physical mode) conducted by**
**Department of English Language Teaching**
**Faculty of Social Sciences & Humanities**

ඉහත පාඨමාලාව සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියාවල නියුක්තියන්ගෙන් සහ පාසල් හැර ගිය සිසුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය.

A. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ එයට සමාන විභාගයක් හෝ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 4 වන මට්ටම හෝ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF ) 2 වන මට්ටමට සමාන පාඨමාලාවක් සමත් වීම

**සහ**

a. අ.පො.ස (සා/පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ( C ) **හෝ**

b. අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා සාමාර්ථයක් (S) **හෝ**

c. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් පිරිනැමීම සඳහා අවශ්‍යතාවයක් ලෙස උගන්වනු ලබන අනිවාර්ය ඉංග්‍රීසි විෂය සඳහා සාමාර්ථයක් **හෝ**

d ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජාතික සහතිකය (NCE) **හෝ**

e. පිළිගත් විශ්වවිද්‍යාලයක මූලික හෝ වෘත්තීය ඉංග්‍රීසි සහතිකය **හෝ**

f. පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි මාධ්‍ය උපාධියක් **හෝ**

අධ්‍යයන මණ්ඩලය විසින් වෙන් වෙන් වශයෙන් ඇගයීම මත සුදුසු යැයි සැලකිය හැකි සහ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් ඕනෑම සුදුසුකමක් **හෝ**

B. පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතික පත්‍රයක්

මීට අමතරව අපේක්ෂකයින් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ලිඛිත හෝ වාචික තේරීම් පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

**<u>කාල සීමාව</u>**

වසරක කාලයකි (සෙනසුරාදා හෝ ඉරිදා දිවා කාලය හෝ සන්ධ්‍යා)

ආරම්භය: **2025** මැයි

**<u>පාඨමාලාව</u>**

මෙම පාඨමාලාවට ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීමේ කුසලතාවය සහ ව්‍යාකරණ මෙන්ම ඉංග්‍රීසි සාහිත්‍යය ද ඇතුළත් වේ. අපේක්ෂකයාගේ කැමැත්ත අනුව භෞතිකව විශ්වවිද්‍යාලය තුළදී හෝ මාර්ගගත ආකාරයෙන් පාඨමාලාවට සම්බන්ධ විය හැක. සියළුම විභාග විශ්වවිද්‍යාලය තුළ භෞතිකව පවත්වනු ලැබේ.

**<u>ගාස්තු</u>**

**සම්පූර්ණ ගාස්තුව රු. 33,500/- (වාරික 2 කින් ගෙවිය හැක. රු. 21,000/- + රු. 12,500/- )**

**<u>අයදුම්පත්</u>**

අයදුම්පත් සහ වැඩිදුර තොරතුරු **https://www.rjt.ac.lk/notice/** හෝ **cdce.rjt.ac.lk/cdce/news.php** යන වෙබ් අඩවිවලින් බාගත කළ හැකි අතර පුද්ගලිකව පැමිණීමෙන් ද ලබාගත හැක. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, සර්වෝදය අසල, බුලංකුලම දිසාව මාවත, 02 පියවර, අනුරාධපුර** යන ලිපිනයට තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පත් සමග උප්පැන්න සහතිකයේ සහ අදාළ ප්‍රවේශ සුදුසුකම් වල පිටපත් අමුණා එවිය යුතුය)

අයදුම්පත සමග තෝරාගැනීමේ පරීක්ෂණ ගාස්තු වශයෙන් ලංකා බැංකුවේ මිහින්තලය ශාඛාවේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය නමින් පවත්වගෙන යනු ලබන **ගිණුම් අංක 5022233 වෙත රු. 500/- ක** මුදලක් බැර කර (ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැක) ලබාගන්නා බැංකු ලදු පත ද එවිය යුතුය.

**දීර්ඝ කළ අයදුම් පත් භාර ගැනීමේ අවසන් දිනය :04.04.2025**

**විමසීම්**

සම්බන්ධීකාරක 071 6858691, 071 4349191

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යනාංශය 025 2266802

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය 025 2260120

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
**මිහින්තලය**
**03. 03. 2025**